# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2356/22 - 2023 නොවැම්බර් මස 02 වැනි බ්‍රහස්පතින්දා - 2023.11.02

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# III වැනි කොටස - ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීම

*මගේ අංකය* : KOT/LND/ACQVI/01/85.
*සංචාරක හා ඉඩම් අමාත්‍යාංශයේ යොමු අංකය* : 4-3/18/2020/WS/43.

මහජන කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම ලබා ගැනීමට ආණ්ඩුව අදහස් කරන බැවි, 1964 අංක 28 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වන වගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

*ලබා ගැනීමට බලාපොරොත්තුවන ඉඩමේ විස්තර* :

දකුණු පළාතේ, මාතර දිස්ත්‍රික්කයේ, කොටපොල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, කුඩලුදෙනිය ග්‍රාම නිලධාරි වසමේ වරල්ල ගමේ පිහිටි මැනුම්පති විසින් පිළියෙල කරන ලද කැඩැස්තර සිතියම් අංක 820645 හි කලාප අංක 01 හි පත්‍ර 01 හි කැබලි අංක 01 වූ ප්‍රමාණයෙන් හෙක්ටයාර් 0.8094 ක් වූ කුඩලුදෙනියහේන මල්වාන නොහොත් මල්වානවත්ත නැමැති පහත සඳහන් ඉඩම් කැබැල්ලට මායිම් :

**01. කැබලි අංක 01**

ඉඩමේ නම: කුඩලුදෙනියහේන මල්වාන *නොහොත්* මල්වානවත්ත; ඉඩමේ විස්තරය : —; හිමිකම් කියන අය : දයාශාන්ත අබේවික්‍රම, “ශාන්ත” හැලපිටිය පාර, ගල්දොල, කොටපොල; ප්‍රමාණය : හෙක්ටයාර් 0.8094.

*උතුරට* : අ.ග.පි. 41 හි කැබලි අංක 103; *නැගෙනහිරට* : අ.ග.පි. 41 හි කැබලි අංක 103; *දකුණට* : අ.ග.පි. 41 හි කැබලි අංක 103; *බටහිරට* : අ.ග.පි. 41 හි කැබලි අංක 103.

ඉහත සඳහන් ඉඩමට හිමිකම් හා අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලුදෙනාම තම තමන් හෝ ඔවුන්ගේ ලියවිලිවලින් බලයලත් අයවලුන් 2023 නොවැම්බර් මස 22 වැනි දින පෙ.ව. 10.00ට කොටපොල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී මා සම්මුඛ විය යුතුයි.

තව ද, 2023 නොවැම්බර් මස 15 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත්, එකී ඉඩම ලබා ගැනීමට, වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත්, වන්දි මුදල සහ ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම් දිය යුතුය.

ඩබ්. පී. ශානිකා අයි. පෙරේරා,
ප්‍රාදේශීය ලේකම්,
කොටපොල.

2023 ඔක්තෝබර් මස 27 වැනි දින,
කොටපොල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

EOG 11 - 0011


ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*